සියලුම හිමිකම් ඇවිරිණි
All Righis Reserved

# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණ 2016

## 9 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය I

නම/විභාග අංකය ------------------------------------------------------------------------------------------------------------------------------------ කාලය පැය 2

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- එක් නිවැරදි පිළිතුරට ලකුණු දෙක බැගින්

01. කුසලචේතනාවන් මත පිහිටා අප සිතාමතා කරන ක්‍රියාවන් හැඳින්වෙන්නේ
(1) කුසල් යනුවෙනි. (2) අකුසල් යනුවෙනි
(3) කර්මය යනුවෙනි (4) පිං යනුවෙනි

02. අපට මෙලොවදීම විපාක ලබාදෙන කර්මය හඳුන්වන්නේ
(1) දිට්ඨධම්මවේදනීය කර්ම යනුවෙනි. (2) උපපජ්ජවේදනීය කර්ම යනුවෙනි
(3) අපරාපරිය වෙදනීය කර්ම යනුවෙනි (4) අහෝසි කර්මය කර්ම යනුවෙනි

03. සියලු දුක් නිමා වීම ලෙස හැඳින්වෙන්නේ"
(1) මරණය ලෙසය (2) නිවන ලෙසය
(3) සෝවාන් ලෙසය (4) අනාගාමී ලෙසය.

04. "යෙ ධම්මා හේතුප්පභවා තේසං හේතුං තථාගතෝ ආහ-----------" යන ගාථා පාඨය ඇතුළත්වන්නේ
(1) චූල්ලවග්ග පාළියටයි (2) මහාවග්ග පාළියටයි
(3) පරිවාර පාළියටයි (4) පරාජිකා පාළියටයි.

05. අප බෝසතාණන් වහන්සේ වෙළෙඳ කණ්ඩායමක නායකයෙකු ලෙස ඉපදී තමාගේ වෙළෙඳ කණ්ඩායමට අත් වීඳීමට තිබූ විනාශයකින් බේරාගත් පුවත සඳහන්වන්නේ
(1) උම්මග්ග ජාතික කතාවෙහිය. (2) අපණ්ණක ජාතක කතාවෙහිය
(3) සාමජාතක කතාවෙහිය (4) වෙස්සන්තර ජාතක කතාවෙහිය

06. සම්බුද්ධ පරිනිර්වානය දැනුම් දීම සඳහා බුදුරජාණන්වහන්සේ විසින් ආනන්ද හිමියින් ලවා භික්ෂූන් වහන්සේලා රැස්කරනලද්දේ
(1) ඉසිපතනේ මිගදායටය
(2) විශාලා මහනුවර වාලුකාරාමයටය.
(3) විශාලා මහනුවර කූටාගාරශාලාවටය

07. සැමදාම මා කෙරෙහි අනුකම්පාවේ දක්වූ බුදු රජාණන්වහන්සේ පිරිණිවන් පානසේක. දක්මට කාගේ පිහිටක්දැයි සිතමින් හැඬූ තෙරුන් වහන්සේ වන්නේ "

(1) රාහුල තෙරුන්වහන්සේය (2) නන්ද තෙරුන්වහන්සේය

(3) ආනන්ද තෙරුන්වහන්සේය (4) ධම්මරාම තෙරුන්වහන්සේය.

08. නායකයා ප්‍රතිපත්තිගරුක කරන දේ කියන කියන දේ කරන අයෙකු විය යුතුය. එම ගුණාංගය ඇතුළත් වන්නේ

(1) ඉවසන සුළුබව තුළින් ය (2) යථාවාදි තථාකාරී බව තුළින් ය.

(3) සුහශීලී බව තුළින් ය (4) නිවැරදි දර්ශනයක් තිබීම තුළින් ය.

09. භාවනාවේදී සුදුසුම වන්නේ පිරිමි දරුවන් බද්ධ පරියංකයෙනුත් ගැහැණු දරුවන් අර්ධ පර්යංකයෙනුත් වාඩි වීමයි. මෙම ඉරියවු වඩාත්ම ගැලපෙන්නේ "

(1) බුද්ධානුස්සති භාවනාවටයි (2) පිළිකුල් භාවනාවටයි

(3) ආනාපානසති භාවනාවටයි (4) මෛත්‍රී භාවනාවටයි.

10. ශාක්‍ය - කෝලිය දෙපිරිස යුද වැදීමට සූදානම් වූ අවස්ථාවේදී බුදුරජාණන්වහන්සේ එය සංසිඳවීමට දේශනාකළ සූත්‍රය දේශනාව වන්නේ "

(1) මහාමංගල සූත්‍රයයි (2) මෙත්තානි සංඝ සූත්‍රයයි

(3) මිත්තානි සංඝ සූත්‍රය (4) කලහ විවාද සූත්‍රයි

11. බුදු දහමට අනුව මිනිස් ගුණ දහම් සුරකෙන සමාජය සදාචාර සම්පන්නය. මේ සඳහා ඉතා සමීප යෙදුම වන්නේ

(1) අධම්ම චරියාව යන්නයි (2) විෂම චරියා යන්නයි

(3) සම චරියා යන්නයි (4) සදාචාර සම්පන්න යන්නයි

12. තම දෙමාපියන් තමාට දුන් මුදල් එකතුකර මරණයට කැප වූ ගවයෙකු නිදහස් කර ගත් පාසල් ළමයි දෙදෙනෙකු පිළිබඳ පුවතක් පුවත් පතක පළවිය. එම ශිෂ්‍යයන් දෙදෙනා කළ පිංකම වන්නේ ,

(1) ධර්මදානමය පිංකමයි (2) ආමිෂ දානමය පිංකමයි

(3) අභයදානමය පිංකමයි (4) සත්ව දානමය පිංකමයි

13. මිනිසෙකුගේ අභිවෘද්ධියට හේතුවන පළමු කරුණ කායික , නිරෝගිතාවයයි. එය ඇතුළත් වන්නේ,

(1) තිලමුට්ඨි ජාතකයේය (2) අත්ථස්සද්වාර ජාතකයේය

(3) මහා ධර්මපාල ජාතකයේය (4) අපණ්ණ ජාතකයේය

14. මහා ප්‍රජාපතිගෝතමිය ඇතුළු කාන්තාවන් විසින් පැවිදි උපසම්පදාව ලබා ගත්තේ "

(1) බණ ඇසීමෙනි (2) සිල් රැකීමෙනි

(3) අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙනි (4) කසාවත් පෙරවීමෙනි.

15. ලෝකපාලන ධර්මයන්හි ''හිරි'' යනු

(1) පව් කිරීමට ඇති ලැජ්ජාවයි (2) පව් කිරීමට ඇති බියයි

(3) කුසල් කිරීමට ඇති ලැජ්ජාවය (4) කුසල් කිරීමට ඇති බියයි

16. චතුරාර්ය සත්‍ය ඇතුළත් සූත්‍රදේශනව වන්නේ

(1) සිගාලෝවාද සූත්‍රයේය (2) මහා පරිනිබ්බාන සූත්‍රයේය

(3) පරාභව සූත්‍රයේය (4) දම්සක් පැවැතුම් සූත්‍රයේය

17. බුදුරජාණන්වහන්සේගේ අන්තිම ශ්‍රාවකයා වූයේ

(1) ආනන්ද තෙරුන්ය (2) සුභද්‍ර තෙරුන්ය

(3) නන්ද තෙරුන්ය (4) භක්කුල තෙරුන්ය

18. මල්ල රජ දරුවන් විසින් පිරිනිවන් පෑ බුදු රජාණන්වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කරන ලද්දේ

(1) ලුම්බිණි උද්‍යානයේදීය (2) උපවර්ථන සල් උයනේදීය

(3) කූඨාගාර ශාලාවේදීය (4) මකුථ බන්ධන නම් ස්ථානයේදීය

19. බුදුරජාණන්වහන්සේ විසින් සසර දුක ඇතිවන සැටිද නැතිවන සැටිද වදාරන ලද්දේ

(1) චතුරාර්ය සත්‍ය ධර්මයේදීය. (2) ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ දී ය

(3) හේතුඵල දහමෙහිදී ය (4) අභිධර්මයේදීය

20. තෘෂ්ණාව අල්ප මාත්‍රයක්වත් ඉතිරිනොවී සහමුලින්ම නැතිවී යන්නේ.

(1) දුක්ඛ ආර්ය සත්‍යයේදීය

(2) දුක්ඛ සමුධයාර්ය සත්‍යයේදී ය

(3) දුක්ඛ නිරෝධාර්ය සත්‍යයේදීය

(4) දුක්ඛ නිරෝධගාමි පටිපදා ආර්ය සත්‍යයේදීය

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. දෙවනවාරයට නියමිත පාසල පදනම්කරගත් ඇගයීමට අදාළව ඔබේ පන්තිකාමරයේ සකස්කරන ලද ඉගෙනුම් හා ඉගැන්වීම් දීර්ඝ කිරීමේ උපකරණ ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. සිව්බඹ විහරණ නම් කරන්න (ල. 2)

ii. සිව්බඹ විහරණ යන්නට සමාන වචනයක් ලියන්න (ල. 2)

iii. සිව්බඹ විහරණ මහා බ්‍රහ්මයා තුළ ඇති අතර මනුෂ්‍යලෝකයෙහි ඇත්තේ කා තුළද ? (ල. 2)

iv. ගේහසිඹ ශීලය යනු කුමක් ද? (ල.2)

v. විරමණ හා සමාදානය යන්නෙහි අර්ථය ලියන්න. (ල.2)

vi. දස කුසල් වලින් දෙකක් ලියන්න. (ල.2)

vii. පොහොයදා සමාදන් වන ශීලය නාම් කරන්න. (ල.2)

viii. සිව්වනක් පිරිස නම් කරන්න. (ල.2)

ix. ගිහියා විසින් සඟ රුවනට සංග්‍රහ කළයුතු කරුණු වලින් දෙකක් ලියන්න. (ල.2)

x. මහා සංඝරත්නය විසින් ගිහි දායකයන්ට සංග්‍රහ කළයුතු කරුණු වලින් දෙකක් ලියන්න. (ල.2)

02. බුදු වරුන්ගේ ම දහම ලෙස පටිච්ඡසමුප්පාද ධර්මය හඳුන්වා ඇත.

i. යේ ධම්මා හේතුප්පබවා යන ගාථාව සම්පූර්ණ කරන්න. (ල.2)

ii. එහි අර්ථය ලියන්න. (ල.3)

iii. පවිටු මිතුරු ඇසුරු නිසා කෙනෙක් දෙලොවම පිරිහෙන අයුරු හේතුඵල ධර්මය ඇසුරින් විස්තර කරන්න. (ල.5)

03. ලොව පහල වූ උත්තරීතර ශාස්තෘවරයා ගෞතම බුදුරජාණන්වහන්සේය.

i. බුදුරජාණන්වහන්සේ තුළ තිබූ නායකත්ව ලක්‍ෂණ දෙකක් ලියන්න. (ල.2)

ii. ඉන් එක් අවස්ථාවක් සඳහා උදාහරණ දෙමින් පැහැදිලිකරන්න. (ල.3)

iii. බුද්ධ සිරිතේ ප්‍රකට නායකත්ව ලක්‍ෂණ ඇසුරින් ශිෂ්‍යජීවිතය සාර්ථක කරගන්නා අයුරු පැහැදිලි කරන්න. (ල.5)

04. විසිරි යන සිත තැන්පත් කිරීමට අපට භාවනාව වැදගත්වේ.

i. "ආනාපානසති භාවනාව" යන්නෙහි අර්ථය ලියන්න. (ල.2)

ii. ආනාපාන සති භාවනාව වැඩීමට පෙර පූර්වකෘත්‍ය ලෙස සිදුකරන කරුණු තුනක් ලියන්න. (ල.3)

iii. ආනාපාන සති භාවනාව වැඩීමෙන් ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකුට ලැබෙන ප්‍රයෝජන විස්තර කරන්න. (ල.5)

05. i. සුඛකාමාණි භූතානි ----යන ගාථාව සම්පූර්ණකර ලියන්න. (ල.2)

ii. එම ගාථාවේ සරල අර්ථය ලියන්න. (ල.3)

iii. "හිංසනයෙන් වැලකී සැමවිටම හිතවාදි වෙමු "යනමාතෘකාව යටතේ බෞද්ධ සඟරාවකට ලිපියක් ලියන්න. (ල.5)

06. i. මහාප්‍රජාපතී ගෝතමියට භාවිතා කළ වෙනත් නමක් ලියන්න. (ල.2)

ii. මහා ප්‍රජාපතිගෝතමියගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ තුනක් ලියන්න. (ල.3)

iii. මහාප්‍රජාපති ගෝතමියගෙන් බුද්ධ ශාසනයට වූ සේවාව විස්තරකරන්න. (ල.5)

07. වත් පිළිවෙත් නොපුරන්නාගේ සිලය සම්පූර්ණ නොවේ. යනු බුද්ධ දේශනාවයි මේ අනුව

i. "වෙයාවච්ච" යනුවෙන් හැඳින්වෙන්නේ කුමක්ද? (ල.2)

ii. ඔබ විහාරස්ථානයට ගියපසු අනුගමනය කළ යුතු වත් පිළිවෙත් තුනක් ලියන්න. (ල.3)

iii. චරිතවත් ළමයෙකුවීමට වත් පිළිවෙත්වල ඇති වටිනාකම උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල.5)